# බළන්ගොඩ නගර සභාව

## 2023-02-14 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2023.02.14**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

**01. පසුගිය සභාවේ 2023-01-10 දිනැති මහා සභා වාර්තාව, 2023-01-11 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-01-30 දිනැති විශේෂ මහ සභා වර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2023-01-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2023-01-11 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-01-30 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2023-01-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2023-01-11 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-01-30 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙම සභා වාර්තාවන්හි සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023-01-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2023-01-11 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-01-30 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා 2023 ජනවාරි මස 25 වන දින විදේශ ගත වූ අතර, එතුමා දිවයිනට පැමිණෙන තෙක් තමන් වැඩ බලන සභාපතිවරයා වශයෙන් කටයුතු කරන බවද මෙම කාලය තුල තම රාජකාරිය ඉටු කිරීම සඳහා සහයෝගය ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට හා නිළධාරී මණ්ඩලයට ස්තුතිවන්ත වන බවද පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2023-02-14 වන දින මහ සභාවට සහභාගී වීමට නොහැකි බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් ඉල්ලමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**පෙ.ව 10.20 ට පමණ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**
**පෙ.ව 10.26 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**
**පෙ.ව 10.27 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**
**පෙ.ව 10.36 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බස්නැවතුම්පල පදික කඩ පිටුපසින් ගලා එන ජලය කඩ තුලට කාන්දු වීම නවතා ගැනීම සඳහා කඩ පිටුපසින් පැති බැම්මක් ඉදි කළ අතර, ඒ සඳහා සභාව වෙත ස්තුතිය පළ කරන බවත්, පැති බැම්ම ඉදි කිරීමෙන් පසු යම් ඉඩ ප්‍රමාණයක් ඉතිරි වූ නිසා එම කොටස තුල ජලය හා අපද්‍රව්‍ය එකතු වී මදුරුවන්

බෝවිය හැකි බැවින් එම ඉඩ ප්‍රමාණය තුල වහලක් ඉදි කිරීමට අවසර ලබා දෙන ලෙසත් වැඩිවන බිම් ප්‍රමාණයට බිම් කුලිය වැඩි කර අය කරගෙන ව්‍යාපාරිකයන් සඳහා එම ඉඩ ප්‍රමාණය ලබා දෙන ලෙසත් ඉල්ලමින් බළන්ගොඩ, පදික කඩ හිමියන්ගේ වෙළඳ සංගමය විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙම කඩ හිමියන් තමන්ගේ කඩ ආරක්ෂා වීම සඳහා පැති බැම්මක් ඉදි කර ගැනීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා, එය ඉටු වූ පසු වැඩි වී ඇති බිම් ප්‍රමාණය ඉල්ලා සිටින බවත්, සභාවට රු.1,500.00 ක් ලබා දෙන නමුත් මෙම කඩ රු.35,000.00 කට වඩා වැඩි ප්‍රමාණයකින් කුලියට ලබා දී ඇති බවත්, සභාවේ දේපල නිසා කරුණු නිසි ලෙස සිදු විය යුතු අතර, අධීක්ෂණයකින් තොරව පුළුල් කිරීමට ඉඩ ලබා දිය නොහැකි බවත්, අයථා ඉදිකිරීම් වෙනුවෙන් සම්බන්ධ වූවත් මේ පිළිබඳව අදහස් නොදක්වන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පැවසුයේ කුහක නොවී තක්සේරු මුදල වැඩි කර මෙම ඉඩ ප්‍රමාණයෙහි අවශ්‍ය ඉදි කිරීම සිදු කර ගැනීමට ඉඩ දෙන ලෙසයි.

මේ සම්බන්ධව ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් වැඩ අධිකාරී විසින් මෙම ස්ථානය අධීක්ෂණය කිරීමෙන් පසුව මෙම කඩ හිමියන් සමඟ සාකච්ඡාවක් කැඳවා සැලසුම් සකස් කර, ඉදිරි කටයුතු සම්බන්ධව තීරණයක් ගැනීම හා එම තීරණය සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට පවසන ලදී.

- බළන්ගොඩ නගර සභා මහජන පොළ බුදු පිළිමය ඉදිරිපිට කුකුල් මස් කඩ කාමරය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG-5/2/1/2 හා 2023-01-24 දිනැති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපල අවභාවිතා කිරීම වැළැක්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 28 දරණ චක්‍රලේඛය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපල අවභාවිතා කිරීම වැළැක්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 37 දරණ චක්‍රලේඛය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ, බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සිදු වූ සිද්ධියක් හේතුවෙන් රාජකාරියට බාධා කිරීමේ චෝදනාව යටතේ තමන් විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව බැංකියවත්ත ප්‍රදේශවාසීන් කිහිපදෙනෙකුට එරෙහිව බළන්ගොඩ පොලිස් ස්ථානය විසින් (අංක 65499) නඩු කටයුතු ආරම්භ කළ අතර, එහි පළමු සාක්ෂිකරු ලෙස තමන්ව නම් කර ඇති බවද බළන්ගොඩ නගර සභාව විසින් මෙම නඩුව සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් සභා තීරණයක් සම්මත කරගෙන ඇති බවද විත්ති පාර්ශවයේ කිසිදු පුද්ගලයෙකු සමඟ තමාගේ පෞද්ගලික අමනාපයක් නොමැති නමුත් මෙම නඩුව ඉවත් කර ගැනීමට තමාගේ එකඟතාවය ලබා දිය නොහැකි බවද එකී සමථවීම තුලින් ඉදිරියේ දී ඇතිවන කිසිදු චෝදනාවක් හෝ අධිභාරයක් සම්බන්ධයෙන් වගකීමකට බැඳිය නොහැකි බවද පවසමින් 2016-09-02 දින සිට 2022 පෙබරවාරි මස දක්වා බළන්ගොඩ නගර සභාවේ ලේකම් වශයෙන් රාජකාරී

කළ එස්.එච්.ජී. කරුණාරත්න යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ, වෙට්නෝල් පාර, නො.54/25 ඩී ලිපිනයේ පදිංචි පී.කේ.එස්.කුමාරතුංග යන අයගේ නිවස පිටුපස කොටස ආසන්නයේ නාය යාමේ අවදානමක් පවතින බවත්, ඒ බව ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් තහවුරු කර ඇති බවත්, කඩිනමින් මෙම ආරක්ෂිත පැති බැම්ම සකසා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇති බවට සඳහන් කරමින් ඒ සම්බන්ධව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- 2023 පෙබරවාරි 03 වන දින නගර සභා ක්‍රීඩා පිටිය අසල පැවැත්වූ සංගීත ප්‍රසංගය අයහපත් කාලගුණය හේතුවෙන් අසාර්ථක වීම නිසා අසරණතාවයට පත් වූ බවද එබැවින් නගර සභාවට ගෙවූ විනෝද බදු රුපියල් ලක්ෂය හා රු.25,000.00 ක මුදලින් යම් කිසි මුදලක් තමා හට නිදහස් කර දෙන මෙන් ඉල්ලමින් බළන්ගොඩ, පරණ පාර, 52/15 ලිපිනයේ එමිල් ප්‍රියශාන්ත ප්‍රනාන්දු යන අය ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04:01 සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර්/ටියුබ් කොලර් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ්, එන්.කේ. ටයර් සෙන්ටර් ඇන්ඩ් ඉංජිනියරින් සර්විස්, ඩී.ටී.එච්.ධර්මසිරි ටයර් හවුස් ප්‍රයිවට් ලිමිටඩ්, හා ජයන්ති ටයර් සෙන්ටර් යන ආයතනවලින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පහත ආයතනයන්ගෙන් ටයර් හා ටියුබ් ලබා ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

| ආයතනය | ටයර් හා ටියුබ්වල ප්‍රමාණය | අවශ්‍ය ටයර් හා ටියුබ්වල ප්‍රමාණය | ඒකක මුදල |
|---|---|---|---|
| ජයන්ති ටයර් සෙන්ටර් | 600 × 16 (8PR) Arpico ටයර් | 06 | රු. 19,500.00 |

| | | | |
|---|---|---|---|
| ජයන්ති ටයර් සෙන්ටර් | 700 × 16 (12PR) Silverace ටයර් | 03 | රු. 39,000.00 |
| ජයන්ති ටයර් සෙන්ටර් | 12.4/11×28 (12PR) ARL ටයර් | 03 | රු. 79,000.00 |
| ජයන්ති ටයර් සෙන්ටර් | 13.6 × 28 (12PR) GRI ටයර් | 02 | රු. 129,500.00 |
| ජයන්ති ටයර් සෙන්ටර් | 700 × 15 (10PR) Silverace ටයර් | 01 | රු. 35,500.00 |
| ජයන්ති ටයර් සෙන්ටර් | 12.4×11×28 ටියුබ් | 04 | රු. 11,800.00 |
| ජයන්ති ටයර් සෙන්ටර් | 15 කොලර් | 03 | රු. 630.00 |
| ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ් | 650 × 16 (10PR) ටයර්( Ceat S/L) | 01 | රු. 37,100.00 |
| ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ් | 600 × 16 India s/l ටියුබ් | 06 | රු. 3,000.00 |
| ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ් | 700 × 16 India s/l ටියුබ් | 03 | රු. 3,200.00 |
| ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ් | 600 × 15 SV ටියුබ් | 03 | රු. 2,800.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:02 ගබඩාව සතුව පවතින ටයර් නැවත පිරවීම (ඩැග් කිරීම) සඳහා මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්, එන්.කේ. ටයර් සෙන්ටර් ඇන්ඩ් ඉංජිනියරින් සර්විස්, ඩී.ටී.එච්.සුපර් ඩැග් ප්‍රයිවට් ලිමිටඩ්, ක්‍රවුන් ටයර් සෙන්ටර් හා ජයන්ති ටයර් සෙන්ටර් යන ආයතනවලින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, සුදුසු ඩැග් වර්ගය තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමු කිරීම හා එහි කමිටු සාමාජිකයන් ලෙස නගර සභාවේ ලේකම්, වැඩ අධිකාරී හා ගණකාධිකාරී පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:03 බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 10 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

ඒ අනුව බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 10 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

එහි දී බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 10 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් බිතුලින්ක් ඉමල්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් හා ජී.කේ.යූ.සී. ඉන්ටනැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතන දෙකෙන් ඉදිරිපත් වී තිබුණි.

| ආයතනය | ප්‍රවාහනය සහිත මිල (රු) | ප්‍රවාහනය රහිත මිල (රු) |
|---|---|---|
| බිතුලින්ක් ඉමල්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් | රු. 38,400.00 | රු.37,750.00 |
| ජී.කේ.යූ.සී.ඉන්ටනැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් | - | රු.38,800 |

ඒ අනුව ප්‍රවාහනය සහිතව තාර බැරල් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ බිතුලින්ක් ඉමල්ෂන් ආයතනය මගින් තාර බැරල් 01 ක් රු. 38,400.00 ක් බැගින් තාර බැරල් 10ක් මිලදී ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

06:01:01 වැලිගෙපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය සඳහා කොම්පෝස්ට් පොහොර කිලෝග්‍රෑම් 500 ක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බළන්ගොඩ නගර සභාවේ කොම්පෝස්ට් පොහොර සඳහා පවතින මිල ගණන්වලට අනුව මුදල් අය කර කොම්පෝස්ට් පොහොර ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 2023-03-18 හා 19 යන දෙදින තුල නිව් රේන්ජස් ක්‍රීඩා සමාජය විසින් පවත්වනු ලබන ක්‍රිකට් තරගාවලිය වෙනුවෙන් ක්‍රීඩා පිටිය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2023-03-18 හා 19 යන දෙදින තුල නිව් රේන්ජස් ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලබන ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම සඳහා ක්‍රීඩා පිටිය ගාස්තු අය කර ගැනීමෙන් තොරව ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 සභාව සතු කඩ කාමර වෙනුවෙන් නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම හා අදාල ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාව සතු පොදු වෙළඳසැල, සාප්පු කඩ, කාර් පාර්ක් කඩ කාමර සහ නව බස් නැවතුම්පොළ කඩ කාමර සඳහා වන නව තක්සේරු වාර්තාව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති අතර, එකී තක්සේරුව 2023 මාර්තු 01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට හා ඊට අදාල ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

එමෙන්ම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද RT/RP/1323 හා 2023-01-23 දිනැති සභාව සතු කඩ කාමර තක්සේරුව අනුව ඉදිරි වසර තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පෙර ගෙවුම් ක්‍රමය යටතේ බදු දෙන ලද කඩ කාමරවල කුලී මුදල් අය කර ගැනීම සඳහා වන අයදුම් පත්‍රය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 බස් රථ හා රථ වාහන ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් 2023 වර්ෂයේ පහත නිවාඩු දිනයන් වෙනුවෙන් සහනයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2023 පෙබරවාරි 04
- 2023 අප්‍රේල් මාසයේ 13,14,15,16 හා 17 වන දින
- 2023 මැයි 01
- 2023 දෙසැම්බර් මස 25
- 2023 වර්ෂයේ සෑම පොහොය දිනකම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව,

- 2023 අප්‍රේල් මාසයේ 13,14,15,16 හා 17 වන දින
- 2023 මැයි 01
- 2023 දෙසැම්බර් මස 25
- 2023 වර්ෂයේ මාර්තු මස සිට දෙසැම්බර් දක්වා සෑම පොහොය දිනකම

බස් රථ හා රථ වාහන ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 සම්පත් පියසට යාබද කඩ කාමරය සඳහා නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක කළ යුතු දිනය තීරණය කිරීම හා අදාල ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියසට යාබද කඩ කාමරය සඳහා මාසික කුලිය තීරණය කිරීම වෙනුවෙන් මීට පෙර තක්සේරුවක් ලබා ගෙන නොතිබුණු බැවින් 2022-11-02 දිනැතිව ලිපියක් යොමු කර එම කඩ කාමරය සඳහා නව තක්සේරුවක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නව තක්සේරුවක් ලබා දී ඇති බව පවසන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා ගිවිසුම් ගත වීමේ දී හා මාසික කඩ කුලිය අය කිරීමේ දී නව තක්සේරු මුදල 2023 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක කිරීම හා ඊට අදාල ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 කොමර්ෂල් හංදියේ සවිකර ඇති සෙලින්කෝ ලයිෆ් හි LED පුවරුවේ ගාස්තු අය කිරීම පිළිබඳව සාකච්ඡා කර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සෙලින්කෝ ආයතනය මඟින් 2021 වර්ෂයේ දී කොමර්ෂල් හංදිය අසල (වත්මන් ASB වෙළඳ ආයතනය ඉදිරිපිට) සවි කර ඇති විද්‍යුත් ප්‍රචාරක පුවරුව වර්ග අඩි 228 කින් යුක්ත වන අතර ඒ සඳහා ප්‍රදර්ශන ගාස්තු අය කිරීමේ දී එවකට ගරු සභාපතිතුමන්ගේ සටහනක් අනුව වාර්ෂිකව වර්ග අඩියකට රු.200.00 බැගින් ගාස්තු අය කරන ලෙස දන්වා ඇති බවද 2021 සහ 2022 වර්ෂයන්හි ගැසට් පත්‍ර අනුව රුපියල් දෙලක්ෂ දහ අට දහස් අටසිය අසූවක මුදලක් සභාව වෙත අය කර ගැනීමට තිබූ නමුත් අය කර ඇත්තේ වාර්ෂිකව රු.45,600.00 ක් බවද පවසන ලදී.

එමෙන්ම 2023 වර්ෂයට අදාල ගැසට් පත්‍රය අනුව විද්‍යුත් ප්‍රචාරක පුවරුවක් වර්ග අඩියක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මාසිකව රු.200.00 ක මුදලක් අය කළ යුතු බව දක්වා ඇති අතර, වර්ග අඩි 228 කින් යුක්ත විද්‍යුත් ප්‍රචාරක පුවරුව වෙනුවෙන් 2023-07-14 දින සිට 2024-07-13 දින දක්වා වූ කාලය සඳහා අය කළ යුතු මුළු මුදල රු.547,200.00 ක් වන බවද මේ සම්බන්ධව සභාව විසින් සාකච්ඡා කර තීරණයක් ගත යුතු බවද ගරු සභාපතිතුමා වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුයේ මෙම විද්‍යුත් පුවරුව මඟින් නගරයට අලංකාරයක් එක්වන බැවින් ගාස්තු පිළිබඳව නොසිතා කටයුතු කළ යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙහි සෙලින්කෝ වෙළඳ දැන්වීම්වලට අමතරව ඔවුන් සමඟ සාකච්ඡා කර නගර සභාවේ යම් යම් සේවාවන් මෙන්ම බළන්ගොඩ ප්‍රදේශයේ විශේෂිත වැඩසටහන් සම්බන්ධව වීඩියෝ පට ප්‍රචාරය කිරීමට අවස්ථාව සලසා ගැනීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් මෙම පුවරුව ඔහුගේ පුද්ගලික ඉඩමක සවිකරගෙන ඇති අතර, මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ගාස්තු ගෙවීම මෙන්ම නඩත්තු ඇතුළු වෙනත් යම් යම් වියදම් ඔවුන් දරන බවද නගරයට ලැබෙන වටිනාකම සලකා සාධාරණ තීරණයක් ගත යුතු බවද තමන් සභාපතිව සිටි කාලයේ දී ගාස්තු තීරණය කරනු ලැබුවේ තනි මතයකට නොව සාමූහිකව ගත් තීරණයක් මත බවද මෙම පාර්ශවය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගාස්තු පිළිබඳව සාධාරණ තීරණයකට එළඹීම සුදුසු බවද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නැවත වරක් අදහස් දක්වමින් පැවසුයේ සාකච්ඡාවක් පවත්වන්නේ නම් බස්නැවතුම්පළ විද්‍යුත් දැන්වීම් පුවරුව පවත්වා ගෙන ගිය අයද එම සාකච්ඡාවට කැඳවීම සුදුසු බවයි.

ඒ අනුව අදාල පාර්ශව සමඟ ගාස්තු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව විශේෂ සභාවක් මඟින් සභා තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

06:01:07 බළන්ගොඩ නගර සභාවට අයත් මැණික් කඩ සංකීර්ණය සම්බන්ධව ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමරවල දීර්ඝකාලීන බදු ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් ඒ සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2022-03-08 දිනැති මහ සභාවේ අංක 06:01:06 යටතේ සාකච්ඡා කළ අතර, එහි දී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නව තක්සේරුවක් මත දැනට සිටින බදුකරුවන්හටම මෙම කඩ ලබා දීමට සභා අනුමැතිය ලබා දුන් නමුත් පළාත් පාලන ආයතනයට වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ගැනුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු බවට ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දී තිබූ බවද පවසන ලදී.

ඒ අනුව 2022-08-24 වන දින මේ සම්බන්ධව වර්තමාන කඩ කාමරවල බදුකරුවන් දැනුවත් කිරීමේ විශේෂ සාකච්ඡාවක් පැවැත් වූ අතර, එහි දී නව තක්සේරුව මත දැනට ව්‍යාපාර සිදු කරන වෙළඳුන් හටම මෙම කඩ ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා මඟින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිඛිතව ඉල්ලීමක් කර එහි උපදෙස් ලැබෙන තෙක් නව තක්සේරු මුදල ගෙවීමට ඉල්ලූ බව ද මෙම කඩ කාමර වසර 30ක කාල සීමාවක් සඳහා දීර්ඝකාලීනව බදු ලබා ගෙන ඇති බදුකරුවන්ගේ ඉල්ලීම පදනම් කරගෙන ගරු රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා හා ව්‍යාපාරික එකමුතුව විසින් නැවත ලංසු කැඳවීමකින් තොරව බදු අයිතිය ලබා දෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කර ඇති අතර, ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බව ද නැවත ලංසු කැඳවා ඉහළම මිලට අදාල කඩ කාමර ලබා දීමට හා බදුකරුවන් විසින් ගිවිසුම් කොන්දේසි කඩ කර ඇත්නම් ඊට අදාලව පියවර ගැනීම සිදු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023-01-23 දිනැති CLG/LG-5/2/1/2 (111) දරණ ලිපිය මඟින් උපදෙස් ලබා දී ඇති බව ද වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් මැණික් කඩ ඉදි කරන අවස්ථාවේ අක් මුදල් ගෙවූ බහුතරයක් අද එහි ව්‍යාපාර කටයුතු සිදු නොකරන අතර, ඇතැම් කඩ වෙනත් අයට ලබා දී ඇති බවද ටෙන්ඩර් කර වෙනත් අය එම කඩ ලබා ගැනීම තුල දීර්ඝකාලයක් ව්‍යාපාරික කටයුතු සිදු කළ අය පීඩාවට පත්වන බවද ඉදිරියේ දී ටෙන්ඩර් කිරීමකට ලක් කලහොත් අත යට ගනුදෙනු පවා සිදුවීමට ඉඩ ඇති බවද, නීත්‍යානුකූලව හැකියාවක් ඇත්නම් දැනට ව්‍යාපාර සිදු කරනු ලබන වෙළඳුන් හටම නව අක් මුදලක් තීරණය කර ලබා දීම සුදුසු වන අතර, එම ව්‍යාපාරිකයන් ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කරන්නේ නම් පමණක් ටෙන්ඩර් කරන ලෙසද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුයේ පසුගිය කාලයේ ඇති වූ විවිධ හේතු නිසා ව්‍යාපාරිකයන් අසීරුතාවයට පත් වී ඇති අතර, ඔවුන්ට හැකි සහනයක් ලබා දීම සුදුසු බැවින් අලුතින් අක් මුදලක් ලබා ගෙන දැනට සිටින වෙළඳුන්හටම ලබා දීම සුදුසු බවයි.

මේ සම්බන්ධව ප්‍රජා සංවර්ධන නිලධාරී ගාමිණී වීරසිංහ මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

2020/03 පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයට අනුව කඩ කාමර බදු දීමේ දී ලබා දිය යුතු නිශ්චිත කාලයක් සඳහන් නොමැති බැවින් ද වර්තමාන ටෙන්ඩර් කැඳවීමේ දී එම 2020/03 චක්‍රලේඛයට අනුව කොන්දේසි වලංගු වන බැවින්ද 1980/46 පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය ප්‍රකාරව බදු දී ඇති එම කඩ කාමර සඳහා වසර 30ක කාලයක් ගිවිසුම් කොන්දේසිවලට ඇතුලත් වී ඇත්තේ ලංසු ඉල්ලුම්පත් කැඳවීම් දැන්වීමේ සඳහන්ව පැවති කොන්දේසි අනුව බැවින් මෙම ගැටළුව උද්ගත වී ඇති බව ද ගරු සභාපතිතුමා පවසන ලදී.

අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව 2020/03 පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයට අනුව බළන්ගොඩ නගර සභාවට අයත් මැණික් කඩ වෙනුවෙන් නව අක් මුදලක් ලබා ගෙන නව තක්සේරුවක් මත පදනම්ව දැනට එම කඩ කාමර අයත් වෙළඳුන්හටම ලබා දීම සඳහා නැවතත් ඉල්ලීමක් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 නගර සීමාව තුල සවි කර ඇති ගාස්තු නොගෙවූ දැන්වීම් පුවරු ඉවත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නගර සීමාව තුල උපකාරක පන්ති පවත්වන බොහෝ ආයතන දැන්වීම් පුවරු, බැනර් සහ කටවුට් ප්‍රදර්ශනය කරන නමුත් ගාස්තු ගෙවා අවසර පත්‍ර ලබා ගෙන නොමැති බවද බළන්ගොඩ නගර සභාව මගින් වාර්ෂිකව බදු දෙනු ලබන දැන්වීම් පුවරු 10 මයික්‍රෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් ලබා ගෙන මාසිකව රු. 31,300.00 ක මුදලක් ගෙවන නමුත් අනවසර දැන්වීම් පුවරු නිසා තමන්ට අසාධාරණයක් සිදු වන බව පවසන බවද මෙම කරුණු සලකා බලා අනවසර දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීම පිළිබඳව තීරණයක් ගත යුතු බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පුවරු සංකල්පය බළන්ගොඩට හඳුන්වා දුන්නේ වීරරත්න නැමැති පුද්ගලයෙක් බවද එය මේ වන විට වර්ධනය වී ඇති බවද, පසුගිය කාලයේ දී දැන්වීම් පුවරු පිළිබඳව ගණනය කිරීමක් කළ අතර, අනවසර දැන්වීම් පුවරු පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලෙසද පවසන ලදී.

ඒ අනුව අවසර ලබාගෙන ඇති නමුත් ගාස්තු නොගෙවූ අය හට එම ගාස්තු ගෙවීමට සති දෙකක කාලයක් ලබා දීම හා එම කාලය තුල නොගෙවන දැන්වීම් පුවරු ඉවත් කිරීම සුදුසු බවට ගරු

නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 කිරිදිගල, වැලිහරනාව මාර්ගයේ සිට අරංගලවත්ත දක්වා ඇති මාර්ගයේ විදුලි රැහැන්වලට හා නිවාසවලට අනතුරුදායක ලෙස පිහිටා ඇති දෙල් ගස ඉවත් කිරීම සඳහා අනුර මහීලාල් යන අය ඉදිරිපත් කර ඇති අවම මිල ගණන වන රුපියල් 24,600.00 ක මුදල අනුමත කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 තම කඩ කාමරය පිටුපස කොටසෙහි තමාගේ වියදමින් යම් ඉදි කිරීමක් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා බළන්ගොඩ, බස්නැවතුම්පල, සී 57 ලිපිනයේ ඊ. තිලංග ප්‍රනාන්දු යන අය 2022-09-13 දිනැති මහ සභාවේ පැමිණිලි හා සංදේශ යටතේ ඉදිරිපත් කර තිබූ ලිපිය සම්බන්ධයෙන් ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම කාරණාව සම්බන්ධ ලිපිය පැමිණිලි හා සංදේශ යටතේ ඉදිරිපත් කර තිබුණු අතර එහි දී සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස වැඩ අධිකාරීතුමාට දන්වා ඇති නමුත් අදාල අය විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බවට දුරකථනය ඔස්සේ පැමිණිල්ලක් තමන්ට ලැබුණු බවද ඒ අනුව කරුණු සොයා බලා සභාව මඟින් ඉදිරි ක්‍රියාමාර්ගයන් තීරණය කරන තුරු ඉදිකිරීම් නවතා දැමූ බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ අනවසරයෙන් යම් ඉදි කිරීමක් සිදු කරන්නේ නම් එම ඉදි කිරීම සභාව විසින් තහනම් කළ යුතු බව හා නිසි ක්‍රමවේදයකින් යුතුව සියලු කටයුතු කළ යුතු බවයි. එමෙන්ම පරිසරය ආරක්ෂා කරගැනීම ඇතුළු යම් යම් දුරාචාරයන්ගෙන් වැළැක්වීම සඳහා වැටක් ඉදි කළ අතර, එය කඩ දමා ඇති බවද ගොඩනැගිල්ල ඉදි කිරීම මඟින් එම ස්ථානයට ආරක්ෂාවක් සැලසෙන නිසා එයට ඉඩ දීමේ ගැටලුවක් නොමැති නමුත් නිසි ක්‍රමවේදයකට සිදු විය යුතු බවද පසුගිය මාස කීපයේදීම සාකච්ඡා කරනු ලැබුවේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් බස්නැවතුම්පළ විද්‍යුත් පුවරුව පැවති කොටසේ කඩ කාමරයක් ඉදි කළ අතර, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් නොගත් බවද පදික කඩ පිටුපස තාප්පයක් ඉදි කිරීමෙන් අනතුරුව ඉතිරි ඉඩ ප්‍රමාණය සඳහා වහලක් සකස් කිරීමට ඉඩ ලබා දීමේ ප්‍රයත්නයක් ක්‍රියාත්මක වන අතර, අත යට ගනුදෙනු සිදු වන

බවද එම කාරණා පිළිබඳව සැලකීමේ දී පරිසරයට යම් පිරිසිදුතාවයක් සිදු වන්නේ නම් තිලංග යන අය හට සාධනීය සහයෝගයක් ලබා දීමේ ගැටලුවක් නොමැති අතර, නියමානුකූලව කටයුතු සිදු විය යුතු බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් අත යට ගනුදෙනු හා හොරකම් සිදු වන අතර, මෙම ඉදිකිරීම එවැන්නක් බවද බස් නැවතුම්පළ පදික කඩය ඉදි කිරීමේ දී හා පදික කඩ පිටුපස කාණුව හා තාප්පය ඉදිකිරීමේ දී සිදු වී ඇත්තේද ගනුදෙනුවක් බවද කෝටි ගණනක් වටිනා ඉඩමකින් මෙම ඉදි කිරීම සිදුව ඇති අතර, කීපදෙනෙක් විසින් මුදල් ගැනීම සිදු කර ඇති බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ මෙම ස්ථානයේ දූරාචාර පවා සිදුවන අතර, ඉදිකිරීම සිදු කිරීම නිසා එවැනි දූරාචාර අවම වන බැවින් මේ සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් සද්භාවයෙන් වැඩ කරන පුද්ගලයෙක් වශයෙන් ලංකා බැංකු මාවත නමින් මාර්ගයක් නිර්මාණය කිරීමට උත්සාහයක් ගත් බවද මෙම අයගේ ව්‍යාපාරික ස්ථානයේ වහලය සහ ඉඩ කොටසේ යම් ප්‍රමාණයක් ඉවත් කරන අවස්ථාවේ දී ව්‍යාපාරයට පිටුපසින් කොටසක් ඉදි කර ගැනීමට ඉඩ ලබා දෙන බවට පොරොන්දු වූ බවද මත්පැන් අලෙවිසැල නිසා මිනිසුන් විසින් අපවිත්‍ර කරනු ලබන ස්ථානයක මෙම ඉදි කිරීම සිදු කිරීම හේතුවෙන් එම දූරාචාර වළකින බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් වැඩ අධිකාරීතුමා විසින් පරීක්ෂා කර බලා ලබා දිය යුතු වාර්තාවට පෙර ඉදිකිරීම් ආරම්භ කිරීම හා වැඩ අධිකාරීතුමා විසින් සකස් කළ සැලසුමට පරිබාහිරව සිදු වන නිසා මෙම ඉදි කිරීම නවතා දැමූ බවද නැවත වැඩ අධිකාරීතුමා විසින් අදාල ස්ථානය පරීක්ෂා කර බලා ලබා දෙන වාර්තාව සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවද ගරු සභාපතිතුමා පැවසීය.

06:01:11 2023 වර්ෂයේ නිල ඇඳුම් දීමනාව ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා රු. 4,000.00 බැගින් ලබා දීම හා ආයුර්වේද වෛද්‍ය නිළධාරී/කාර්මික නිළධාරීන්/සෞඛ්‍ය පරිපාලක/වැඩ පරිපාලක/පොදු වෙළඳසැල් භාරකරු යන අය හට නිල ඇඳුම් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 බළන්ගොඩ නගර සභාවේ විදු නැණ පියස මධ්‍යස්ථානයේ අන්තර්ජාලය භාවිත කිරීම වෙනුවෙන් පැයක් සඳහා රු.100.00 ක මුදලක් අය කිරීම හා නව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවේ විදු නැණ පියස මධ්‍යස්ථානයේ අන්තර්ජාලය භාවිත කිරීම වෙනුවෙන් පැයක් සඳහා දැනට අය කරනු ලබන ගාස්තුව රු. 50.00 ක් වන අතර, වර්තමානය වන විට මෙම ගාස්තුව ප්‍රමාණවත් නොවන බැවින් එය රු.100.00 දක්වා වැඩි කළ යුතු බව ද පහත සඳහන් නව පුහුණු වැඩමුළු ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවද පවසන ලදී.

I. කෘතිම බුද්ධිය (Artificial Intelligence – AI) හා ක්ලවුඩ් තාක්ෂණය මඟින් කාර්යාලයීය හෝ පෞද්ගලික වැඩ කටයුතු පහසු කර ගැනීම පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව - රු. 3,000.00

II. පාසල් දරුවන් සඳහා පරිගණක ක්‍රම ලේඛනය (Computer Programming)පිළිබඳ තනි පුද්ගල පුහුණු පාඨමාලාව (මාස 06) - මාසයක් සඳහා රු. 2,000.00

ඒ අනුව ගරු සභාපතිතුමන් විසින් බළන්ගොඩ නගර සභාවේ විදු නැණ පියස මධ්‍යස්ථානයේ අන්තර්ජාලය භාවිත කිරීම වෙනුවෙන් පැයක් සඳහා රු.100.00 ක මුදලක් අය කිරීම හා ඉහත පුහුණු පාඨමාලා ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම සහ වෙන්දේසි හා අපහරණ කමිටුව පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න | නාගරික ලේකම් |
| 02 | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මයා | ගණකාධිකාරී |
| 03 | ජී.ඩී.ඒ.සේමපාල මිය | ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී |
| 04 | ජේ.සී.මධුරංග විජේපාල | විමර්ශන නිළධාරී |
| 05 | සිසිර සේනාධීර මයා | වැඩ අධිකාරී |
| 06 | සම්පත් කුමාර | සංවර්ධන නිළධාරී |
| 07 | නදීකා සුභාෂිනි මිය | කළමනාකරණ සේවා නිළධාරී |
| 08 | එන්.සී.කාමිලා මිය | කළමනාකරණ සේවා නිළධාරී |
| 09 | චිත්‍රා නිශාන්ති මිය | කළමනාකරණ සේවා නිළධාරී |
| 10 | තක්ෂිලා අබේසිංහ | සංවර්ධන නිළධාරී |
| 11 | ඉදුනිල් ප්‍රියන්ත මයා | සංවර්ධන නිළධාරී |
| 12 | ෂැලෝම් ඒන්ජල් වාස් මිය | කළමනාකරණ සේවා නිළධාරී |
| 13 | අමිල ලක්මාල් මයා | සංවර්ධන නිළධාරී |
| 14 | ඩබ්.එස්.මෙනේරිවත්ත මිය | කළමනාකරණ සේවා නිළධාරී |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසිය හා අපහරණ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා වෙන්දේසි හා අපහරණ කමිටුව පත් කළ යුතු බවද 2022 වර්ෂයේ භාණ්ඩ

සමීක්ෂණයට අනුව පොදු 47 හි "S" සහ "D" අක්ෂරවලට අයත් භාණ්ඩ වෙන්දේසි කිරිමට අදාළ භාණ්ඩ තාක්ෂණික නිළධාරී විසින් තක්සේරු කර වටිනාකම අවම ලංසුව ලෙස ගෙන වෙන්දේසි කර ලැබූ මුදල සභාව වෙත භාරදීමට කටයුතු කරන බවද "D" අක්ෂරයෙන් ඇති භාණ්ඩ විනාශ කිරීමටත්, "R" අක්ෂරයෙන් ඇති භාණ්ඩ අලුත්වැඩියා කිරීමටත්, "T" අක්ෂරයෙන් ඇති භාණ්ඩ නිසි පරිදි මාරු කිරීමට කටයුතු කරන බවත් ඒ පිළිබඳ වාර්තාවක් අපහරණ ක්‍රියාවලියෙන් පසුව සභාව වෙත ලබාදිමට කටයුතු කරන බවත් පවසන ලදී.

ඒ අනුව 2022 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව සඳහා ඉහත සඳහන් නිළධාරී මණ්ඩලයට අමතරව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 බස්නැවතුම්පොළ අසල ගුවන් පාලමේ "Front Line" ආයතනයේ ප්‍රචාරක පුවරුවක් සවි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 2023 පෙබරවාරි 18 වන දිනය තුල ලයන්ස් ක්‍රීඩා සමාජය විසින් පවත්වනු ලබන ක්‍රිකට් තරඟාවලිය වෙනුවෙන් ක්‍රීඩා පිටිය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2023 පෙබරවාරි 18 වන දිනය තුල ලයන්ස් ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලබන ක්‍රිකට් තරඟාවලිය පැවැත්වීම සඳහා ක්‍රීඩා පිටිය ගාස්තු අය කර ගැනීමෙන් තොරව ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 2022 ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාලව රු. 36,530.91 ක මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07:01:01 ආනන්ද මෛත්‍රී මාවත පිවිසුම් මාර්ගයේ සිට ඉදිරියට මීටර 200 ක් පමණ ප්‍රමාණයක කාණු පද්ධතියෙහි කැලි කසල සිරවී ඇති අතර, වර්ෂාව නිසා සම්පූර්ණයෙන් කාණු පිටාර දැමීම හේතුවෙන් නිවස් තුලට මෙම ජලය ගලා යාමෙන් මාර්ගයටද අවදානම් තත්ත්වයක් පවතින බැවින් අදාල ආයතන දැනුවත් කර කඩිනමින් විසඳුමක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් කාණු සුද්ධ නොකිරීමේ චෝදනාව තමන්ට හා ගරු නාගරික මන්ත්‍රී මංගලිකා ඉලංකෝන් මැතිතුමියට එල්ලවන බවද මාර්ග සංවර්ධන අධිකාරිය හරහා මෙතෙක් විසඳුමක් නොලැබුණු බැවින් බළන්ගොඩ නගර සභාව හරහා මෙම තත්ත්වය පැහැදිලි කර කඩිනමින් එම ආයතනය දැනුවත් කළ යුතු බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පෙට්ටිගල මාර්ගයේ මස්සැන්න දක්වා සුද්ධ කිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු නොකරන අතර, ඒ පිළිබඳවද දන්වා යවන ලෙස පැවසීය.

ගරු සභාපතිතුමා පැවසූයේ පවතින අවදානම් තත්ත්වය පැහැදිලි කර, කාණු සුද්ධ කිරීම සිදු කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා ලිපියක් යොමු කිරීම සිදු කරන ලෙසයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:02:01 තක්සේරු ලේඛනයට නම ඇතුලත් කිරීමේ ගාස්තුව සංශෝධනය කිරීම

07:02:02 The update club නැමැති සංවිධානය විසින් බළන්ගොඩ අධ්‍යාපන කලාපයේ තෝරාගත් දුෂ්කර පාසල් කිහිපයක දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමට අරමුදලක් රැස් කිරීම සඳහා බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය ජාතික පාසල් ශ්‍රවණාගාරයේ පවත්වන "ස්පන්ධ" නැමැති සංගීත වැඩසටහනේ ප්‍රචාරක පුවරු කිහිපයක් මාර්තු මස 05 වෙනි දින දක්වා නගරයේ නොමිලේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

තක්සේරු ලේඛනයට නම ඇතුලත් කිරීමේ ගාස්තුව සම්බන්ධයෙන් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මීට පෙර රු.600.00 ක්ව පැවති ගාස්තුව මේ වන විට රු.5,000.00 ඉක්මවා ඇති බවද එය විශාල මුදලක් බැවින් තක්සේරු ලේඛනයට නම ඇතුලත් කිරීමේ ගාස්තුව වශයෙන් රු. 1,500.00 ක මුදලක් සුදුසු බව යෝජනා කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා පැවසුයේ එම මුදල අඩු කිරීම සඳහා තමන් විරුද්ධත්වය ප්‍රකාශ කරන බවයි.

මේ සම්බන්ධව ගණකාධිකාරීතුමාගෙන් අදහස් විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

අනතුරුව 2023 මාර්තු 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල සීමාව තුල තක්සේරු ලේඛනයට නම ඇතුලත් කිරීමේ ලියාපදිංචි ගාස්තුව රු.1,500.00 ක් වශයෙන් සංශෝධනය කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් The update club නැමැති සංවිධානය විසින් බළන්ගොඩ අධ්‍යාපන කලාපයේ තෝරාගත් දුෂ්කර පාසල් කිහිපයක දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමට අරමුදලක් රැස් කිරීම සඳහා බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය ජාතික පාසල් ශ්‍රවණාගාරයේ පවත්වන "ස්පන්ධ" නැමැති සංගීත වැඩසටහනේ ප්‍රචාරක පුවරු කිහිපයක් මාර්තු මස 05 වෙනි දින දක්වා බස්නැවතුම්පළ, තුඹගොඩ, බලගහමුල ඔරලෝසු කණුව අසල,මහජන බැංකුව අසල,දොරවෙල පාලම අසල සහ බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය ජාතික පාසල අසල නොමිලේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසද මාර්තු 05 වන දිනෙන් පසු එම සියලු ප්‍රචාරක පුවරු ඉවත් කර ගන්නා බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2023-02-09 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

02.2022 දෙසැම්බර් මස කර්මාන්ත අංශය මගින් සිදුකළ කර්මාන්තවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම.

03. මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීම

- ගරු නාගරික මන්ත්‍රී ඊ.ජේ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා (යෝජනා අංක 03:01:01 සිට 03:01:02 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රීනි ජී .චන්ද්‍රලතා මැතිතුමිය ( යෝජනා අංක 03.02.01 සිට 03:02:03 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ( යෝජනා අංක 03.03.01 සිට 03:03:02 දක්වා)

04. ලිපි මඟින් ලැබෙන යෝජනා

- බලංගොඩ,කොටුගොඩැල්ල, පාරේ කොටුව පෙදෙස මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

ඉහත සඳහන් කර්මාන්ත වෙනුවෙන් යන්ත්‍ර, සේවකයන් හා රථවාහන ලබාගැනීම සඳහාත්, 2022 පෙබරවාරි මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත කර්මාන්ත සහ නඩත්තු කටයුතු ඉටුකිරීම සඳහාත් නිර්දේශය ලබා දීම

මෙහි දී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ කර්මාන්ත කමිටු වාර්තාවේ දෙනියකුඹුර පාර ප්‍රිමික්ස් යොදා ඇති බවට සටහන් කර ඇති නමුත් එසේ සිදු වී නොමැති බවයි.

**08:02 2023-02-07 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. කර්මාන්ත අංශයේ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ගල් අයිතම මිලදී ගැනීම වෙනුවෙන් එන්.කේ.ටී.එස්. ගුණවර්ධන මහතා වෙත රු. 393,750.00 ක බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම

02. සභාව සතු ZA-5326, ZA-9835, HF-7899, ZA-5039 යන වාහනවල රක්ෂණය ඉදිරියේ දී අලුත් කිරීමට ඇති බැවින් හා ස්ථාවර වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීම සඳහා මෙම වාහන තක්සේරුවක් කිරීමට අනුමැතිය ලබා දීම හා ඒ සඳහා කමිටුවක් පත් කිරීම

03. ගබඩා අවශ්‍යතා මිලදී ගැනීම

04. HF-7899 ජේසීබී යන්ත්‍රයෙහි ප්‍රෝවීල් ජොයින්ට් එක අලුත්වැඩියා කිරීමට අනුමැතිය ලබා ගැනීම හා ඇස්තමේන්තුව අනුමත කිරීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**ප.ව 12.42 ට පමණ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2023-01-01 සිට 2023-01-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 15,958,749.84 |
| වෙනත් ලැබීම් | 13,186,550.57 |
| මුලු ලැබීම් | 29,145,300.41 |
| පුනරාවර්තන වියදම් | 6,614,204.23 |
| වෙනත් වියදම් | 15,629,818.11 |
| මුලු වියදම් | 21,875,362.34 |

**2023-01-01 සිට 2023-01-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| RD-8000 | 36,900.00 |
| 56-1906 | 48,600.00 |
| 227-5020 | 145,800.00 |
| RD - 8240 | 86,985.00 |
| VI1833 | 136,900.00 |
| 226-7521 | 36,450.00 |
| BC-0005 | 48,600.00 |
| GC 0001 | 9,250.00 |
| LL - 7688 | 24,300.00 |
| JD-4684 | 5,920.00 |
| ND-5124 | 110,970.00 |
| PF-4006 | 114,210.00 |
| QL-2901 | 21,830.00 |
| RC-1107 | 82,260.00 |
| RC 1118 | 52,650.00 |
| GK 1483 | 52,650.00 |
| ZA- 5039 | 12,150.00 |
| 37-7933 | 4,050.00 |
| SDRRY0013 | 9,720.00 |
| RE - 2600 | 86,175.00 |
| UQ1933 | 6,290.00 |
| HF -7899 | 122,920.00 |
| HF -8558 | 2,025.00 |
| FP - 0002 | 17,750.00 |
| RB 4786 | 81,000.00 |
| එකතුව | 1,356,355.00 |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**ප.ව 1.01 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එස්.ජී.ජෝර්ජ් මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් මෙම සභා වාරය අවසන් සභා වාරය විය හැකි බැවින් පළමුවෙන්ම ඒ පිළිබඳව සහ සභාවේ සමහර මන්ත්‍රීවරුන් ඉදිරි පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් නොවන බැවින් ඒ පිළිබඳවද තම කණගාටුව ප්‍රකාශ කර සිටින බවද කෙසේ වුවද සභාවේ වත්මන් මන්ත්‍රීතුමන්/තුමියන්ලා සියළුම දෙනා නැවත වරක් මෙම සභාවට තේරී පත් වීමට තම සුභාශිංසන එක් කරන බවද තම කොට්ඨාශයට අයත් උඩකන්ද මාර්ගයේ අඩුපාඩු සකස් කිරීම තමන් කොතෙක් ඉල්ලීම් සිදු කළද සිදු නොවූ බවද ප්‍රකාශ කර සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් බුලත්ගම සුසානභූමියේ වල් බිහි වී ඇති බවද වල්නාශක නොලැබීම හේතුවෙන් එසේ වල් බිහි වී ඇති බැවින් හැකි ඉක්මනින් එම වල්නාශක ලබා දී සුසානභූමිය ශුද්ධ කිරීමේ කටයුතු සිදු කර දෙන ලෙසද ඇවිදින මංතීරුවේ සතුන්ගෙන් අපවිත්‍ර වී ඇති

බවට බොහෝ දෙනෙකු පවසන බැවින් ටෙන්ඩරය ලබා ගෙන ඇති අය එම පිරිසිදු කිරීම් නොකරන්නේ නම් සභාවෙන් සේවකයන් යොදවා හෝ එම ස්ථානය පිරිසිදු කිරීමට කටයුතු සලසා දෙන ලෙසද මෙම සභාව අවසන් සභාව විය හැකි බැවින් සභා වාරය අවසන් වීමට ප්‍රථම ආනන්ද මෛත්‍රී මාවත ශුද්ධ කිරීමේ කටයුතු කර දෙන ලෙසද ප්‍රකාශ කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගරය දොරවෙල ඔය පිටාර ගැලීමෙන් දෙවරක්ම පීඩාවට පත් වූ බැවින් ඒ පිළිබඳව තමන් ලිපිගොනු සකසා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කර ඇති බවද එම ලිපිගොනු ඉදිරි වැඩකටයුතු සඳහා නගර සභාව වෙත භාරදීමට හැකි බවද තමා වෙළඳ සංගමයේ සභාපති ලෙස හදිසියේ බළන්ගොඩ නගරය තුළ පවත්නා සතොස ශාඛාව වසා දැමීම පිළිබඳව අදාළ බලධාරීන්ගෙන් විමසූ බවද ප්‍රකාශ කළ අතර නගරයට අත්‍යවශ්‍යම අවශ්‍යතාවයක් වන තුඹගොඩ බස්නැවතුම්පොළ ඉදිකිරීමේ කටයුතු සිංහ සමාජයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව තමන් විසින් ඉටු කර දෙන බවද ඒ සඳහා සභා අනුමැතින් අවශ්‍ය තැන්වලදී ලබා දෙන ලෙසද පවසන ලදී.

තවද, ඇවිදින මංතීරුවේ සතුන්ගෙන් අපවිත්‍ර වීම් සඳහා පිරිසිදු කිරීම් කර දෙන ලෙසද නගර සභාවෙන් වෙළඳ බලපත්‍ර ලබා දීමේදී කඩ හිමියන් සඳහා ගිනි නිවන උපකරණ භාවිතයද අවශ්‍ය නිර්ණායකයක් කරගන්නේනම් හදිසි අවස්ථාවල එය ඉතා වැදගත් බවත් අවසාන වශයෙන් නගර සභා ආඥා පනත අනුව කටයුතු කරන්නේ නම් කිසිඳු අයෙකුට කිසිඳු වැරදීමක් සිදු නොවන බවද ප්‍රකාශ කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තුඹගොඩ බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා අනුමත කිරීමේ ලිපිය සභාවට ඉදිරිපත් කර මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් අවසර ලබා ගැනීම කළ යුතු බවත් තමන් මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වූ ආකාරය පිළිබඳ මතකාවර්ජනයක්ද සිදු කරන ලදී.

ජනතා සේවය තම ප්‍රමුඛ අරමුණ බැවින් සභාවේ සභාපතිවරයා කවුරුන්ද පක්ෂය කුමක්ද යන්න නොව සැබෑ ලෙස ජනතාව වෙනුවෙන් සේවය කිරීම පමණක් අවශ්‍ය බවද හිටපු සභාපති ගරු චමික ජයමිණි විමලසේන මැතිතුමා එතුමාගේ ධූර කාලය තුළදී පක්ෂ දේශපාලනයෙන් ඔබ්බට ගොස් තමා හට ජනතා සේවාව ලබා දීමේ තම අරමුණ වෙනුවෙන් විවිධ අවස්ථා වලදී සහයෝගය ලබා දුන් බවද වර්තමාන සභාපති ගරු ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමාද ඒ ආකාරයෙන්ම තමා ඉල්ලීම් කළ බොහෝ ඉල්ලීම් ඉටු කර දී ඇති බවද වැඩබලන සභාපතිවරයෙකු වශයෙන් කටයුතු කරන ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාද එසේම නන් අයුරින් උපකාර කළ බවද මන්ත්‍රීවරයෙකු වශයෙන් වැඩ කිරීමේදී නගර සභාවේ හිටපු ලේකම්තුමියගේ සහයෝගයද අගය කරන බවද වර්තමාන ලේකම්තුමා ඇතුළු සියළුම කාර්යයමණ්ඩලයේ සහයෝගයද අගය කරන බවද විවිධ දේශපාලන කණ්ඩායම් නියෝජනය කරමින් මන්ත්‍රීවරු මෙම සභාවට පැමිණියද ඇතැම් අවස්ථා වල මතවාද වලට පැමිණියද සභාව තුළ ක්‍රියාකාරී වීමේදී එකම සහෝදර කණ්ඩායමක් ලෙස ක්‍රියා කරන බවද නැවත වරක් මැතිවරණයට තරඟ වැද

මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සියළු දෙනාටම ඊළඟ සභාව නියෝජනය කිරීමට හැකි වේවා යිද ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමන් 1991 වර්ෂයේ නගර සභාවට තේරී පත් වී මේ වන විට හය වතාවක් සභාපතිවරයෙකු ලෙසද තුන් වතාවක් මන්ත්‍රී වරයෙකු ලෙසද අවස්ථා ගණනාවකදී මෙම සභාවේ සේවය කර ඇති බවද තමාගේ එම ධූර කාලයන්හි බළන්ගොඩ නගර සභාවට ලබා ගත හැකි සියළුම සම්මාන වරප්‍රසාද ලබා දුන් බවත් එමෙන්ම තමාගේ ඡන්ද දායකයන් සියළුම දෙනාට නගර සභාවෙන් ලබා දිය හැකි උපරිම සේවාවන් ලබා දුන් බවද මෙවර මැතිවරණයේදී තමන් කොට්ඨාශයක් නියෝජනය නොකරන බවද ජාතික ලයිස්තුවෙන් ඉදිරිපත් වන බවද තමන් සභාපතිවරයෙකු හා නාගරික මන්ත්‍රී වරයෙකු ලෙස නගර සභාව වෙනුවෙන් ඉටුකළ සේවාව පිළිබඳ තෘප්තිමත් වන බවද පවසන ලදී.

එසේම වර්ෂ ගණනාවක් සේවය කිරීමේදී තමාට සහයෝගය ලබා දුන් නාගරික මන්ත්‍රීතුමන්/තුමියන්ලා සියළුම දෙනාටද සියළුම නාගරික ලේකම්වරුන් ඇතුළු කාර්යමණ්ඩලයටද පුවත්පත් කලාවේදී මහත්වරුන්ටද ස්තුති වන්ත වන බවද සියළුම දෙනාට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරන බවද ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් සභා වාර කිහිපයකදීම අවසාන සභාව යැයි මන්ත්‍රීතුමන්/තුමියන්ලා ප්‍රකාශ කරමින් තම අදහස් ප්‍රකාශ කළද මෙම සභා වාරය සත්‍ය වශයෙන්ම අවසන් සභා වාරය විය හැකි බවද සභාව තුළ විවිධ අදහස්,මතවාද වලට අනුව වාද විවාද සිදු කර ගත්තද සභාවේ මන්ත්‍රී කණ්ඩායමේ සියළුම දෙනා සහෝදරත්වයෙන් බැඳී සිටින බවද එසේ වාද විවාද සිදු කරන ලද්දේ තමා නියෝජනය කරන කොට්ඨාශයට වැඩක් කර ගැනීමට මිස පෞද්ගලික අමනාපකම්වලට නොවන බවද සත්‍ය වශයෙන්ම තමන්ගේ කොට්ඨාශයට මාර්ග,ජල ,පැතිබැම් ආදී සංවර්ධන වැඩකටයුතු සිදු කර තමන් වැඩකර ඇති බවද මෙවර පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වී ඇතත් ඒ පිළිබඳ තීරණය ජනතාව සතු බවද කෙසේ වුවද මෙම වර්ෂ පහක කාලසීමාව තුළ නගර සභා මන්ත්‍රීවරු ඇතුළු කාර්යමණ්ඩලය හා පුවත්පත් කලාවේදීන් යන සියලු දෙනා ලෙස ඵකගත් සහෝදරත්වය සැමදා ඵකගමු යැයිද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් වසර නවයක නගර සභාවේ සේවාවේ අත්දැකීම් සහ එහි අවසන් සභාව යන තේමාව ඔස්සේ තම අදහස් දැක්වීම ආරම්භ කරන බවත් ඒ අනුව එහිදී තමන් නගර සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් සේවාව ආරම්භ කරන විටත් තමාට නගර සභාව පිළිබඳ යම් දැනුමක් තිබූ බවත් එයට හේතුව තම පියා සහ මාමා මෙම නගර සභාව තුළ සභාපතිවරුන් ලෙස සේවය කිරීම බැව්ද එසේම නාගරික මන්ත්‍රී වරයෙක් ලෙස තේරී පත්වූ මුල් අවධියේ

හිටපු සභාපති ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සමග වැඩකිරීමේදී හැලහැප්පීම් සමග වැඩ කර ඉතා හොඳ පන්නරයක් ලබා ගත් බවද වර්තමාන වැඩ බලන සභාපතිතුමා සහ සභාපතිතුමා සමඟද විවිධ හැල හැප්පීම් සිදු වූ බවද පවසන ලදී.

වැඩි දුරටත් අදහස් දක්වමින් තමන් සභාපති ධූරයට පත් වූ පසු විශාල සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ඇතුළුව දීර්ඝ කාලීන සංවර්ධන ක්‍රියාවලියකට යාමට සැලසුම් කළ අතර ඒ අනුව ක්‍රියාත්මක වූවානම් බළන්ගොඩ නගරය ලංකාවේ වේගයෙන්ම සංවර්ධනය වූ නගරය බනට පත් වීමට හැකියාව තිබූ බවද විවිධ කණ්ඩායම් මැදිහත් වී එම සංවර්ධන ව්‍යාපෘති සියල්ලම අත්හිටවූ බවද එම කණ්ඩායම බළන්ගොඩ නගරයට අහිමි වූ සංවර්ධනයට වගකිවයුතු බවද වංචාවෙන් දූෂණයෙන් තොරව විනිවිදභාවයෙන් තමන් වැඩ කළ බැවින් නගර සභාවේ හිටපු ලේකම්තුමිය ඇතුළු සියළු කාර්යයමණ්ලයේ උපරිම සහයෝගය තමන්ට ලැබුන බවද පසුගිය සහරාන් ප්‍රහාරය, කොවිඩ් වසංගත තත්වයන් හමුවේ සමහර වැඩ කටයුතු කිරීමට නොහැකි වූ බවද නමුත් ආදායම් එකතු කිරීම විශාල වශයෙන් සිදු වූ බවද තමා සැලසුම් කළ තුරු උයන්හල හෙළ බොජුන්හල ව්‍යාපෘතිය,පොළ තනි වහලයකට ඉදිකිරීම,පොදු වෙළඳසැල පිටුපස වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යන සියළුම දෑ පොදු ජන එක්සත් පෙරමුණේ සංවිධායක ඇතුළු කණ්ඩායම නිසා නගරයට අහිමි වූ බවත් කෙසේ හෝ ඔවුන් බලය ලබාගෙන මේ වන විට සත්‍ය ලෙසම ඉටුකළ සංවර්ධනයක් නොමැති බවද තිබූ නගරය තවමත් ඒ ආකාරයෙන්ම පවතිනවා මිස කිසිඳු සංවර්ධනයක් නොමැති බවද පවසන ලදී.

සියළු දෙනා පුද්ගලික වාසි තකා පමණක් ක්‍රියා කරන බවද සමාන අදහස් දරන කණ්ඩායමක් නගර සභාව වෙත අවශ්‍ය බවද එවැනි කණ්ඩායමක් තමාට නොමැති බැවින් මැතිවරණයට ඉදිරිපත් නොවන බවද ජනතා විමුක්ති පෙරමුණේ වැඩි කණ්ඩායමක් මෙම සභාව වෙත පත් වෙන්නේනම් එය ඉතා හොඳ දෙයක් වේවි යැයිද මැතිවරණයට ඉදිරිපත් වී ඇති සියළු දෙනාටම නැවත වරක් මෙම සභාව වෙත තේරී පත්වී සත්‍ය වශයෙන්ම ජනතා සේවය ලබා දීමට හැකි වේවායිද කිසිඳු අයෙකු සමඟ පුද්ගලික තරහක් වෛරයක් නොමැති බවද ප්‍රකාශ කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12.අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමාට වැඩබලන සභාපති ධූරය වැනි තනතුරක් ලැබුනේ තමාගේ ඡන්දදායකයන් නිසා බවත් පළමුවෙන්ම තමන් වෙනුවෙන් ඡන්දය ලබා දුන් ජනතාවට ස්තුතිවන්ත වන බවද නගර සභාවේ සේවය කළ වර්ෂ 17 පුරාවටම තමන් පාලන පක්ෂය නියෝජනය කල බවද එබැවින් තමා අපේක්ෂා කළ ජනතා සේවය ලබා දීම හැකි සෑම විටම ලබා දිය හැකි වූ බැවින් මෙවර පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වීම අභියෝගයක් නොවන බවද මහජනතාව වෙනුවෙන් ලබා දුන් සේවාව පිළිබඳ තමා තෘප්තිමත් වන බවද පවසන ලදී.
එසේම සෑම අවස්ථාවකදීම වැඩබලන සභාපතිවරයෙකු, නාගරික මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කිරීමේදී තමාද රාජ්‍ය නිලධාරියෙකු බැවින් නගර සභාවේ සෑම රාජ්‍ය නිලධාරියෙකුගේම ගෞරවය ආරක්ෂා වන පරිදි ක්‍රියාකර ඇති බවද සෑම අයෙකුටම පක්ෂයක්, ලාංඡනයක් යනාදිය පවතින්නා සේම තමාටද එලෙස පවතින බවද එය හුදෙක් දේශපාලන අදහස පමණක් බවද නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු වැඩබලන සභාපතිවරයෙකු ලෙස පත්වීමේදී සියළුම නගර වැසියන් තමාගේ නගර වැසියන් බවද සියළු මන්ත්‍රී වරුන් තමාගේ මන්ත්‍රී මණ්ඩලය බවද වර්තමානයේ ඇතැම් දේශපාලන කණ්ඩායම් අරගල තුලින්

ජයග්‍රහණය අපේක්ෂා කළද අවසානයෙහි එහි කිසිඳු ජයග්‍රහණයක් නොමැති බවද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් සෑම විටම මෙම නගර සභාවේ අයවැය ප්‍රතික්ෂේප කළ බවද එය සැබෑ ලෙසම මහජන සේවය ලබා දීමට අකුල්හෙලීමක් බවද පවසන ලදී.

කෙසේ වුවද දේශපාලනය කිරීමේදී බිම් මට්ටමින් සිතා බලා ජනතාවගේ ප්‍රශ්න ගැටළු හඳුනාගෙන ඒවාට පිළියම් සෙවිය යුතු බවද ඊට පටහැනිව වියත් අදහස් පමණක් මත ක්‍රියා කිරීමට ගොස් දේශපාලන වශයෙන් අසමත් වු පාලකයන් සිටින බවද සමහරුන් බලය ලැබුණු පසු ජනතාව අමතක කරන බවද එවැනි දේශපාලකයන්ට හොඳම පිළිතුරක් ළඟ එන මැතිවරණයේදී ජනතාව ලබා දෙනු ඇතැයිද එබැවින් සැබෑ ලෙසම ජනතාවට සේවය කළ හැකි අයට මෙම සභාව නියෝජනය කිරීමට හැකි වේවායිද මේ දක්වා සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රී මණ්ඩලය සහ බළන්ගොඩ නගර සභාවේ සියළු කාර්යමණ්ඩලයට ස්තුතිය පුද කරන බවද අදදින සභාවේ කටයුතු සාර්ථකව පවත්වා ගෙන යාමට සහයෝගය ලබා දුන් සියළු දෙනාටද ස්තුතිවන්ත වන බවද ප්‍රකාශ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව. 1.52 ට පමණ අවසන් කරන ලදී.

**එම්.ටී.එම්.රුමි,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.